



# බාල පරපුරට සෙනෙහස දක්වමු

දිනක් කලීෆා අබුබක්ර් සිද්දීක් රලියල්ලාහු අන්හු තුමා අසර් සලාතය ඉටු කර පයින් ඇවිද ගියේ ය. එතුමා සමඟ අලි රලියල්ලාහු අන්හු තුමා ද ගමන් කළේ ය. එවිට කුඩා දරුවන් සමඟ ක්‍රීඩා කරමින් සිටි හසන් රලියල්ලාහු අන්හු තුමා දැක ඔහු ඔසවා තම උරහිස මත තබා ගත් අබුබක්ර් රලියල්ලාහු අන්හු තුමා "අල්ලාහ් මත දිවුරමි! මොහු නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ හැඩරුවට සම වන්නේ ය; අලි රලියල්ලාහු අන්හු තුමා මෙන් නොවන්නේ ය'' යැයි පැවසී ය. එයට සවන් දුන් අලි රලියල්ලාහු අන්හු තුමා මඳ සිනහ පාමින් ළඟින් සිටගෙන සිටියේ ය. (බුහාරි, මුස්ලිම්)

මෙම සිද්ධිය මගින් ඔබ අවබෝධ කර ගන්නේ කුමක් ද? මුස්ලිම් සමාජයේ කුඩා දරුවන්ට කෙතරම් වැදගත්කමක් දී තිබේ ද? ඔවුන් කෙරෙහි දක්වා ඇති අවධානය වටහා ගත හැකි ද? සහාබාවරු කුඩා දරුවන්ට ආදරය දක්වා ඇත්තෝ ය. ඔවුන්ට මූලිකත්වය දී ඇත්තෝ ය. ඔවුන් සතුටට පත් කර ඇත්තෝ ය. "තමන්ට ද ගරුත්වයක් ලැබේ" යන මානසිකත්වයක් ඇති කළහ. බාල පරපුරට කරුණාව දක්වන ලෙස ඉස්ලාම් ධර්මය බලකිරීම ඊට හේතුව වේ.



වත්මන් සමාජයේ දරුවන් සියලු දෙනා අනාගත සමාජයේ සාමාජිකයෝ වන්නෝ ය. ඔවුන් සෞඛ්‍ය සම්පන්න මෙන් ම යහපත් පෞරුෂත්වයකින් යුතු අය ලෙස හදා වඩා ගත යුතු ය. ඔවුන්ගෙන් ලෝවැසියන්ට යහ ප්‍රයෝජන ලබාගත හැක්කේ එලෙස හදාවඩා ගත්විට පමණි. එසේ නොවේ නම් සමාජයේ විවිධාකාර බලපෑම් ඇති වීමට ඉඩ තිබේ.

කුඩා දරුවෝ වැඩිහිටියන්ගේ ආදරය, රැකවරණය, ආරක්ෂාව අපේක්ෂා කරති. එම ආදරය ඔවුන් තුළ උනන්දුව සහ උත්සුක භාවය ඇති කරයි. ඔවුහු වැඩිහිටියන්ගෙන් බොහෝ දෑ බලාපොරොත්තු වෙති. ආහාර ශරීරය වඩන්නාක් සේ ආදරය හා රැකවරණය මනස සහ යහපත් සිතුවිලි ප්‍රවර්ධනය කරයි. ආදරය නොලැබුණු කුඩා දරුවෝ කලකිරීමට පත්වෙති; සමාජයෙන් ඈත්ව සිටීමට උත්සාහ කරති. කඩිසර බව ගිලීහි ගොස් වැරැදි කිරීමට පටන් ගනිති. කාලයාගේ ඇවෑමෙන් ඔවුන් මහා අපරාධකරුවන් බවට පරිවර්තනය වීමේ අවස්ථා උදා වේ.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් කුඩා දරුවන් සිපගන්නා අයුරු දැක පුදුමයට පත්ව "මාහට දරුවෝ 11 දෙනෙක් සිටිති. එක දරුවකු හෝ මෙසේ සිපගෙන නොමැත්තෙමි" යැයි විස්මයෙන් ප්‍රකාශ කළ ගැමියෙකුට "අල්ලාහුතආලා ඔබේ සිතෙන් කරුණාව උදුරා ගත්තේ නම් මා කුමක් කරන්න ද?" යැයි නබිතුමා දුන් පිළිතුර දෙස අපගේ අවධානය යොමු වේ.

ලොවෙහි මානව වර්ගයාගේ අඛණ්ඩ පැවැත්ම සඳහා අල්ලාහ් කුඩා දරුවන් බිහි කරයි. කුඩා දරුවෝ අල්ලාහ්ගේ දායාදයෝ වෙති. සෑම දරුවෙක් ම යහපත් පුද්ගලයකු ලෙස උපත ලබයි. අයහපත් පුද්ගලයකු ලෙස කිසිවකු උපත ලබන්නේ නැත. වැඩිහිටියන්ගේ හදාවඩා ගැනීම හා මගපෙන්වීම මගින් ඔවුහු යහපත් මාර්ගය හෝ අයහපත් මාර්ගය දෙසට යොමු වෙති. වැඩිහිටියන් ඔවුන් වෙත දක්වන ආදරය ඔවුන් යහමාර්ගය වෙතට යොමු කරයි. දෙමාපියන් තම දරුවන්ට ආදරය දැක්විය යුතුයි. එමගින් ඔවුන් ද එය වටහා ගෙන ඒ අනුව ක්‍රියා කරනු ඇත.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ නිවසේ හැදී වැඩුණු අබූ හෆ්ස් රලියල්ලාහු අන්හු තුමා මෙසේ පවසන්නේ ය. "මම නබිතුමාගේ නිවසේ හැදී වැඩුණෙමි. දවසක් දා මම ආහාර අනුභව කරන විට මගේ අත ආහාර බඳුනේ ඒ මේ අත යොමු විය. "ඕ දරුව! අල්ලාහ්ගේ නාමය පවසා අනුභව කිරීම ආරම්භ කරන්න. දකුණතින් අනුභව කරන්න. ඔබ ළඟින් තිබෙනා දේ අනුභව කරන්න" යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. ඉන් පසුව මාගේ ආහාර අනුභව කිරීමේ පුරුද්ද ඒ අනුව හැඩ ගැසිණි. (බුහාරි, මුස්ලිම්)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ කුඩා දරුවන්ට අධික ලෙස ආදරය දක්වති; ඔවුන්ට සලාම් පවසති; ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරති; තම වාහනයේ නංවා ගනිති. හිස පිරිමදිති; ආහාරය සඳහා පලතුරු මෙන් ම වෙනත් ආහාර ද දෙති; ඔවුන්ට සාරධර්ම කියා දෙති; ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරුකරමින් කටයුතු කරන්නැයි අධික ලෙස උපදෙස් දී ඇත්තාහ.

වරක් අම්ර් රලියල්ලාහු අන්හු තුමාගේ බිරිඳ "මම ඔබට යමක් දෙන්නෙමි" යැයි පවසා තම පුතා කැඳවූවා ය. "ඔබ ඔහුට කුමක් දෙන්නෙහි දැ?" යි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ විමසූහ. "රටඉඳි" යැයි ඇය පැවසුවා ය. එවිට නබිතුමාණෝ "ඔබ එම රටඉඳි ඔහුට නුදුන්නෙහි නම්, රැවටූ බවට ඔබගේ පුස්තකයේ සටහන් කෙරෙනු ලබන" බව පැවසූහ. (අබූ දාවූද්)



කුඩා දරුවන් සාරධර්ම ඉගෙන ගන්නේ වැඩිහිටියන්ගෙනි. තම සිත ප්‍රිය කරන අය මෙන් කටයුතු කිරීමට ඔවුහු උත්සාහ ගනිති. ආහාර, ඇඳුම්, ආගමික අවබෝධය, ආදරය, සත්‍යය, සාධාරණත්වය, ගෞරවය, කරුණාව, වැඩිහිටියන්ට ගරු කිරීම, කුඩා දරුවන්ට ළෙන්ගතු වීම, සෙසු ජීවීන්ට කරුණාව දැක්වීම, දේව නැමඳුමෙහි යෙදීම යනාදිය වැඩිහිටියන් අනුගමනය කොට ඉටු කරන ක්‍රියාකාරකම් වේ. එබැවින් ශ්‍රේෂ්ඨ මගපෙන්වීම් ඔවුන්ට ලබාදීමේ වගකීම වැඩිහිටියන් සතු වේ. උසස් වූ සමාජ ළැදියාව වන්නේ ද එය යි.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ සිඟිත්තන් තුළ කුඩා කල සිට ම හික්මීම හා පරිණත භාවය පුහුණු කරති. දිනක් හසන් රලියල්ලාහු අන්හු තුමා සදකා වශයෙන් ලද රටඉඳිවලින් එකක් කටේ දමා ගත්තේ ය. මෙය දුටු නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා "කෙළ ගසනු! කෙළ ගසනු! සකාත් වශයෙන් ලැබෙන ආහාර අප අනුභව නොකරන බව ඔබ නොදන්නෙහි ද?" යැයි ඇසූහ. (බුහාරි, මුස්ලිම්)

යහපත අයහපත, හලාල් හරාම්, යහගුණ දුර්ගුණ යනාදිය කුඩා කල සිට ම පුරුදු පුහුණු කළ යුතු ය. එය ස්ථිර ලෙස පිළිපදිමින් පැමිණිය යුතු ය. මෙම කරුණෙහි නොසැලකිලිමත්කම පෙන්විය යුතු නොවේ. "ඔවුන් එහි ස්ථිරව සිටිත්දැ?" යි සොයා බැලිය යුතු ය. කුඩා කල සිට මෙම කරුණු සිතේ තැන්පත් වූ විට කිසිවිටෙකත් ඔවුහු මඟ වරදවාගනු නොලබති.

එතුමා සලාතයේ සජ්දාවේ සිටින විට කුඩා ළමුන් එතුමාගේ පිට උඩ නැග සෙල්ලම් කරති. එවැනි අවස්ථාවල දී එතුමාණෝ ඔවුන් වෙනුවෙන් සුජූදයේ සිට ප්‍රමාද වී නැගිටිති. සලාතයේ දී පවා එතුමා සිඟිත්තන් කෙරෙහි දැක්වූ ආදරය වටහා ගැනීමට හැකි වනවා නොවේ ද?

බාල පරපුර කෙරෙහි ආදරය දැක්වීම ද, වැඩිහිටියන්ට ගෞරව දැක්වීම ද ඉස්ලාමීය සාරධර්ම වේ. "මීට පටහැනි ලෙස ක්‍රියා කරන්නෝ මුස්ලිම්වරු නොවෙති"යි පවසා ඉස්ලාමය අපට අවවාද කරයි.

එනිසා අපට වඩා බාල පරපුර කෙරෙහි ආදරය, කරුණාව දක්වා ඔවුන්ට රැකවරණය ලබා දී වැඩිහිටියන්ට ගරු කරමින් ද ජීවත් වෙමු.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

رُكُوْعٌ سُجُوْدٌ حَرَامٌ حَلَالٌ

**අභ්‍යාස**

1. බාල වයස්කරුවන් වැඩිහිටියන්ගෙන් අපේක්ෂා කරන කරුණු පහ ලියන්න.
2. හසන් රලියල්ලාහු අන්හු තුමා කාගේ පුතා ද? අබූබක්ර් රලියල්ලාහු අන්හු තුමා ඔහු උරහිස මත තබා ගත්තේ ඇයි?
3. ආදරය නොදක්වන ලද දරුවන්ට ඇති විය හැකි අයහපත් බලපෑම් තුනක් ලියන්න.
4. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා අබූ හෆ්සා රලියල්ලාහු අන්හා තුමාට දුන් දැනමුතුකම් මොනවා ද?
5. දෙමාපියන් වුව ද දරුවන්ට බොරු නොකිව යුතු බව අවධාරණය කරන හදීසය ලියන්න.
6. කුඩා දරුවන්ට නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා ආදරය දැක්වූ අයුරු පවසන්න.
7. ඔබ, ඔබට වඩා වයසින් බාල අය කෙරෙහි ආදරය දැක්වූ අත්දැකීමක් සඳහන් කරන්න.